# ධරණීය සංවර්ධනයක් උදෙසා උරුම සංකල්පයේ වැදගත්කම: රතු ඉන්දීය නායක සියැටල් ගේ ඓතිහාසික ලියවිල්ල ඇසුරින්

**දීපිකා උදයංගනී විජේතුංග**

කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම
deepikawijetunge@gmail.com

## හැඳින්වීම

උරුමය කතිකාවක් වශයෙන් විවිධ ක්ෂේත්‍රයන්හි දී සාකච්ජාවට බඳුන් වෙයි. ඒ සඳහා විවිධ වර්ගීකරණයන් ඉදිරිපත් කළ හැකි ය. සංස්කෘතික උරුමය (Cultural Heritage) සහ ස්වාභාවික උරුමය (Natural Heritage) ඒ සඳහා ඉදිරිපත් කළ හැකි එක් වර්ගීකරණයකි. ස්පර්ශීය උරුමය (Tangible Heritage) සහ න-ස්පර්ශීය උරුමය (Intangible Heritage) තවත් එක් වර්ගීකරණයකි. පුරාවිද්‍යාත්මක උරුමය ස්පර්ශීය උරුමයක් වශයෙන් දැක්විය හැකි අතර එය භෞතික සාධක පදනම් කරගනිමින් අධ්‍යයනයට බඳුන් කරනු ලැබේ. මිනිසා පරිසරයට අනුගතවීම මානව සංස්කෘතිය නිර්මාණයෙහි පදනම වෙයි. එ බැවින් අතීත මානවයින් ජීවත් වූ පරිසර තත්ත්ව සහ මානව සමාජත්, ඔවුන් නිර්මාණය කරන ලද භෞතික අවශේෂත් පුරාවිද්‍යාවේ දී හඳාරනු ලැබේ. මෙහි දී පුරාවිද්‍යාඥයා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස මානවකෘති (Artefacts) සහ පරිසරකෘති (Ecofacts) කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. එය සංස්කෘතික උරුමය ලෙස අධ්‍යයනයට ගනු ලබන ධාරාවකි. අතීත මානව සමාජ අධ්‍යයනය කිරීමේ තවත් එක් ක්‍රමවේදයක් ලෙස මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයන් පුරාවිද්‍යාවේ දී භාවිතයට ගනු ලබන අතර නගරීකරණයට බඳුන් නොවූ සාම්ප්‍රදායික ගෝත්‍ර සමාජයන් හි පවතින සිරිත්විරිත්, අභිචාර සහ තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ ව සන්සන්දනාත්මක වශයෙන් අධ්‍යයනය කරමින් අතීත මානව සමාජ සහ ඔවුන්ගේ චර්යා රටාවන් ප්‍රතිනිර්මාණය කිරීම මෙහි දී සිදුකරනු ලැබේ. එය අයත් කළ හැකි වන්නේ නස්පර්ශීය උරුමය (Intangible Heritage) යන කොටසට ය. එ බැවින් පුරාවිද්‍යාත්මක උරුම සංකල්පයේ දී මෙකී උරුමයන් ද්වය කෙරෙහි ම අඩු වැඩි වශයෙන් අවධානය යොමුකරනු ලැබේ. මුල් කාලයේ දී මිනිසුන් පරිසරයට අනුගත වෙමින් ජීවත් වීමත් සරල සමාජ සංකීර්ණ සමාජ බවට පරිවර්තනය වීමේ දී ඇතැම් අවස්ථාවල දී මිනිසා විසින් පරිසරය වෙනස් කිරීම්වලට බඳුන් කිරීමත් දක්නට ලැබේ. සංකීර්ණ සමාජවල දී එකී සමාජ සංවර්ධන ක්‍රියාදාමයන් කෙරෙහි යොමුවන අතර එය නූතන සමාජ යන්හි විවිධ අංශයන්හි වර්ධනය පෙන්නුම් කරන්නක් බවට පත් ව ඇත. මෙම ක්‍රියාදාමයේ දී උරුමයන් ආරක්ෂාකරමින් මෙය සිදුකිරීම අත්‍යවශ්‍ය කරුණක් ව පවතින අතර ඒ කෙරෙහි උරුම කළමණාකරුවන්ගේ අවධානය යොමු වි ය. එ බැවින් උරුමය ආරක්ෂා කරමින් සංවර්ධනය කරා ගමන් කිරීම කෙරෙහි ප්‍රතිපත්ති සකසන්නන්ගේ මෙන් ම ඒවා ක්‍රියාත්මක කරන්නන්ගේ ද අවධානය මෙම සියවසේ මුල් භාගයේ සිට ම යොමු වූ අතර එය ධරණීය සංවර්ධන (Sustainable Development) සංකල්පය තීව්‍ර කිරීමක් බවට පත් ව තිබේ. ඒ අනුව ධරණීය සංවර්ධනයක් උදෙසා උරුමය ආරක්ෂා කිරීමේ දී සංස්කෘතික උරුමය සහ ස්වාභාවික උරුමයත් ස්පර්ශීය උරුමය සහ න-ස්පර්ශීය උරුමය කෙරෙහිත් අවධානය යොමුකිරීම වැදගත් ය.

අතීත මානව සමාජ පරිසරය හා බැඳුණු අයුරුත් ඔවුන් පරිසරය සමඟ දක්වන අභේදනීය සබඳතාවත් පෙන්වන ඓතිහාසික ලියවිල්ලක් වශයෙන් 1854 දී

රතු ඉන්දීය නායක සියැටල් (Chief Seattle) විසින් ඇමරිකානු රජයට කරන ලද විශේෂ කථාව හැඳින් විය හැකි ය. ගෝත්‍ර සමාජයක් ලෙස ඔවුනට අයත් ව පැවති ඔවුන්ගේ නිජබිම් රජයට පවරා ගැනීමෙන් පසු ව ඔවුනට මුහුණ දීමට සිදුවන තත්ත්වයත් එ මිගින් විනාශවන සොබාදහමත් ඒ හා බැඳුණු ගෝත්‍ර ජන ජීවිතයත් පිළිබඳ සංවේදී ලියවිල්ලක් වන මෙය ස්වාභාවික උරුමය සහ ඒ හා බැඳි සංස්කෘතික උරුමයේ වටිනාකම පිළිබඳවත් පෙන්වන්නක් ලෙස අධ්‍යයනය කළ හැකි ය.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය මූලික වශයෙන් ම ඓතිහාසික මූලාශ්‍රය පදනම් කරගනිමින් සිදුකරනු ලැබේ. එහි දී ප්‍රධාන මූලාශ්‍රය ලෙස භාවිතයට ගනු ලබන්නේ 1854 දී රතු ඉන්දීය නායක සියැටල් විසින් ඇමරිකානු රජයට කරන ලද විශේෂ කථාවයි. මෙම ලියවිල්ල පාදක කොට ගනිමින් නූතන උරුම සංකල්පය උදෙසා මෙහි පවතින උපයෝගීතාව හඳුනාගැනීම සඳහා අදාළ වෙනත් ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්විතීයික මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. මේ සඳහා තොරතුරු සම්පාදනය කිරීම සඳහා අන්තර්ජාලය උපයෝගී කරගැනීම ද සිදුකරන ලදී.

## පර්යේෂණ ප්‍රතිඵල

ධරණීය සංවර්ධනයේ දී උරුමය ආරක්ෂා කිරීමේ වැදගත්කම මීට සියවස් ගණනාවකට පෙර ලෝකයට කියාදුන් ශ්‍රේෂ්ඨ චරිතයක් ලෙස රතු ඉන්දීය නායක සියැටල් හැඳින් විය හැකි ය. 1854 දී ඔහු විසින් ඉදිරිපත් කරන ලද මෙම ඓතිහාසික ලියවිල්ල සීරුවෙන් පරීක්ෂා කිරීමේ දී එහි අන්තර්ගතවන කරුණු ධරණීය සංවර්ධනයක් උදෙසා ස්වාභාවික උරුමයෙහි පවතින වැදගත්කම පෙන්වා දෙන ආකාරය හඳුනාගත හැකි ය. ප්‍රාථමික ගෝත්‍ර සමාජයක නායකයා වශයෙන් ඔහු සතු වූ අත්දැකීම් සහ සහජ ඥානය ඔස්සේ සංකීර්ණ සමාජ රාශියක් පාලනය කරන නායකයකු වෙත දෙනු ලබන පණිවුඩයේ ගැඹුර සහ වටිනාකම සුළු කොට තැකිය නො හැකි ය. ඒ අනුව ස්වභාවික උරුමය සහ ඒ හා බැඳි සංස්කෘතික උරුමයේ වටිනාකම පිළිබඳවත් පෙන්වන ඓතිහාසික ලියවිල්ලක් වශයෙන් නූතන උරුම සංකල්පය හඳුනාගැනීමටත් ධරණීය සංවර්ධනයක් උදෙසා උරුමය ආරක්ෂා කිරීමේ වැදගත්කම සාකච්ඡා කිරීමත් මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අපේක්ෂිත ය.

## ආශ්‍රේය ග්‍රන්ථ

ගුණවර්ධන, ප්‍රිශාන්ත., (2005) පුරාවිද්‍යා උරුමය, ආකෘති, සංකල්ප සහ කළමණාකරණය. රාජගිරිය: සමන්ති පොත් ප්‍රකාශකයෝ.

Cleere, C.F., (1989) Archaeological Heritage in the Modern World. London: Unwind and Hyman.

ICOMOS. (1980) Charter for Protection and Management of Archaeological Heritage : Paris.

ICOMOS (1974) The Protection of Cultural Property: Handbook of National Legislations, Paris.

http://www.archives.gov/publications/prologue/1985/spring/chief-seattle.html

Detailed research calling into question the very existence of the speech, based on the Bureau of Indian Affairs records at the National Archives, by Jerry L. Clark.

http://www.geocities.com/Athens/2344/chiefs3.htm

Research by Per-Olof Johansson in Denmark

http://www.kyphilom.com/www/seattle.html

"Chief Seattle's Thoughts" - two versions of the speech, by Duane Bristow